www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයට බැඳෙන්න

**Join the International Students for Social Equality!**

2010 ජනවාරි 14

විසිවන සියවසේ වූ යුද්ධයන්, ප්‍රචන්ඩත්වය සහ දිළිදුකම නව සහශ්‍රකයේ දී අවසන් වේ යැයි තිබූ කවර හෝ බලාපොරොත්තුවක් විසිඑක්වන සියවසේ දෙවන දශකයට මානව වර්ගයා ඇතුල්වන විටදී, ජාත්‍යන්තර සබධතාවන්ගේ කොන්දේසි මගින් විනාශ කර දමා ඇත.

ලෝක ආර්ථිකයේ ඒකාග්‍රකරනය, තාක්ෂනයේ සහ සන්නිවේදනයේ අතිවිශාල ඉදිරිවර්ධනයන් තිබියදීත් බිලියන ගනනක් බඩගින්නේ සහ මානව වර්ගයා නොනවතින යුද්ධයන්ට මැදි වී සිටි. දශකය ආරම්භ වුයේ හයිටිවල භූමිකම්පාවෙනි. බටහිර අර්ධගෝලයේ දුප්පත් ම රට වන මෙහි සිදුවූ මරන සංඛ්‍යාව සමාජ අසමානතාවයේ දරුනුතම විපාක පෙන්නුම් කරයි.

එක්සත් ජනපදයේ දී, මිලියන ගනනක් දිළිඳුභාවයට තල්ලු කර ඇති අතර මහා අවපාතයෙන් (1930) මෙහා කවර කලකදීටත් වඩා රැකියා අහිමි කර ඇත. බැංකුවලට ට්‍රිලියන ගනනක් ප්‍රධානය කිරීමෙන් පසුව එක්සත් ජනපද ආන්ඩුව -ප්‍රාන්ත සහ මධ්‍යම යන දෙඅංශයෙන්ම - අධ්‍යාපන සහ අනෙකුත් සමාජ වැඩසටහන්වලට පෙරනොවූවිරූ ප්‍රහාර එල්ල කරමින් සිටී.

අනිවාර්යෙන්ම තවත් මූල්‍ය අර්බුදයකට මාවත පාදමින් නව සමපේක්ෂන බුබුලු වැඩි දියුනු කරමින් මූල්‍ය ප්‍රභූ ස්ථරය, වංශවත් පැලැන්තියක ආක්‍රමනශීලීත්වය හා අයිතිවාසිකම් පිලිබඳ හැඟීම සමගින් එය විසින් ම ඇතිකල අර්බුදය තමන්ව ම යෝධ ලෙසින් පොහොසත් කරගැනීමට ගසා කා ඇත.

රට තුල කම්කරු පන්තියට එරෙහි යුද්ධය රටින් පිට යුද්ධයත් සමග බැදී තිබේ. බුෂ්ගේ "විසිඑක්වන සියවසේ යුද්ධයන්," ඉදිරියට ගෙනයමින් ඔබාමා ඇෆ්ගනිස්ථානයේ මෙහෙයුම තීව්‍ර කර ක්ෂනිකව නො නවතින"ත්‍රස්ථවාදයට එරෙහි යුද්ධයට" යේමනය නව භව්‍ය ඉලක්කයක් ලෙස අලුතින් එක් කර ගත්තේ ය. එසේම එක්සත් ජනපදය, ඉරානයට සහ චීනයට එරෙහි තර්ජනයන් උත්සන්න කරමින් සිටී.

කම්කරු පන්තියේ ස්වාධීන් මැදිහත්වීමක් නොමැතිවුවහොත් ගැඹුරුවන ජාත්‍යන්තර ගැටුම් විසිවන සියවසේ දීට වඩා ලේවැකි ලෝක යුද්ධයක් කරා ගෙනයන යා හැක.

### සමාජවාදී ක්‍රියාමාර්ගයක්

සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) යුගයේ බරපතල ගැටලු විසදාලිය හැක්කේ ජාත්‍යන්තර කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයකින් පමනක් බව අවධාරනය කරන ලොව පුරා සිටින ශිෂ්‍යයන්ගේ සංවිධානයකි. සියලු අවශ්‍යතාවන් සංගත ලාභ ගැරීමට සහ පුද්ගල ධන සමුච්ඡය කරගැනීමට යටත් කර ඇති ධනපති ක්‍රමය මගින් මානව ප්‍රගතිය අහුරා දමා ඇත.

### සසජාශි ඉල්ලීම

**ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ යුද්ධ නතර කරනු!** ඉරාකයෙන්, ඇෆ්ගනිස්ථානයෙන් සහ එක්සත් ජනපදය යටත් කිරීමට මාන බලන අනෙකුත් රටවලින් එක්සත් ජනපද සහ අනෙකුත් පුද්ගල හමුදා බලකායන් කොනදේසි විරහිතව ආපසු කැඳවන ලෙස සසජාශි බල කර සිටී. ඇමරිකානු යුද යාන්ත්‍රනය කුඩු කර දැමිය යුතු අතර ඒ සඳහා වැය කරන විශාල ධනස්කන්ධය ඇමරිකානු බෝම්බ මගින් විනාශ වූ සමාජයන්ගේ ප්‍රතිසංසවිධානය සඳහාත් ඇමරිකාව තුලම දැවෙන සමාජ අවශතා සැපිරීමටත් යෙදවිය යුතු ය.

**අධ්‍යාපනය සහ සමාජ වැඩසටහන් සඳහා බිලියන ගනන් මුදල්!** රැකියා අවශ්‍ය සියලුම දෙනා සඳහා රැකියා අවස්ථා සම්පාදනය සඳහා ජාත්‍යන්තර පරිමානව දැවැන්ත සම්පත් ප්‍රතිපාදන ලෙස වෙන් කල යුතු යැයි සසජාශි බල කර සිටී. ආහාර සහ නිවාස, පාසල් නැවත ගොඩනැගීම, සෞඛ්‍ය ආරක්ෂනය සඳහා අවස්ථා පුලුල් කිරීම සහ කම්කරුවන්ට තරුනයින්ට යෙදී ගත හැකි සංස්කෘතික ආයතන ඇතුලු මහජනතාවගේ මූලික අවශ්‍යතා සම්පාදනය සඳහා විශාල වැඩ කොටසක් ඉටු කිරීමට පවතී.

**බැංකු සහ විශාල සමාගම් ජනසතු කරනු !** බිලියන සංඛ්‍යාත මහජනයා මුහුන දී සිටින අර්බූදයට කුමන හෝ විසඳුමකට ප්‍රධාන බාධකය වන්නේ මූල්‍ය ප්‍රභූ පැලැන්තියයි. ලෝක ආර්ථිකය මත ඔවුන්ගේ ආධිපත්‍ය බිඳීම සඳහා බැංකු සහ විශාල සමාගම් වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර පාලනය යටතේ ජනසතු කල යුතු යැයි සසජාශි කියා සිටී.

**සමාජ සමානතාවය සඳහා!** එක්සත් ජනපදයේ සහ ලොව පුරා පවත්නා දැවැන්ත පරිමාන සමාජ අසමානතාවය සමග ප්‍රජාතන්ත්‍රවදය නොගැලපේ. ධනවතුන් සඳහා තියුනු බදු වැඩි කිරීමක් සහ සමපේක්ෂනයෙන් සහ වංචාවෙන් ගොඩගසාගෙන ඇති මහා ධනස්කන්ධයන් පවරා ගැනීම වැනි ධනය නැවත බෙදාහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු යැයි සසජාශි කියා සිටී.

## කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා

වැඩිවන ටියුෂන් ගාස්තු, විශාල නය, නිදහස් අධ්‍යාපනයේ සම්පත්වල හිගය වැනි ශිෂ්‍යන් මුහුන දෙන ගැටලු කම්කරු පන්තිය මුහුන දී සිටින පුලුල් ගැටලුවලින් වෙන් කල නොහැක. මේ ගැටලු කිසිවක් විශ්වවිද්‍යාල මට්ටමින් විසඳිය නොහැක. යුද්ධයට සහ අසමානතාවයට විරුද්ධ වීමේ මංසොයන ශිෂ්‍යයෝ රටපුරාත් ජාත්‍යන්තරවත් කම්කරු පන්තිය වෙත ආකර්ෂනය විය යුතු ය.

කම්කරු පන්තිය දෙසට හැරී ගැනීම වෘත්තීය සමිති සමග සන්ධානයක් අදහස් නොකරයි. කම්කරු පන්තියේ ආරක්ෂකයින් යයි අදහස් කරන මෙම සංවිධාන ධනවත් විධායක නිලධාරීන් සහ ව්‍යාපාර කලමනාකාරීත්වයේ කොටස්කරුවන් විසින් ආධිපත්‍යය දරනු ලැබෙති. කම්කරුවන්ගෙන් සහන කොල්ලකෑමේ දී සහයෝගීව සිටින ඔවුහු කම්කරුවන් දේශපාලන සංස්ථාපිතයට බැඳතබා ගැනීමට මං සොයති. සෑම කොටසකම කම්කරුවන් සහ තරුනයින් ඒකාබද්ධ කිරීම සඳහා සියලු අධ්‍යාපනික ආයතනවල, වැඩපලවල්වල සහ ප්‍රාදේශීයව ස්වාධීන ක්‍රියාකාරී කොමිටු ගොඩනගන ලෙස සසජාශි ඉල්ලා සිටී.

ඒ සියල්ලටමත් වඩා ව්‍යාපාරික තන්ත්‍රයේ පක්ෂවන ඩිමොක්‍රටික් සහ රිපබ්ලික් පක්ෂවලට එරෙහිව කම්කරු පන්තියට තමන්ගේම දේශපාලන පක්ෂයක් අවශ්‍ය වේ. විරෝධතා සහ උද්සෝෂන මගින් ව්‍යාපාරික ප්‍රභූ තන්ත්‍රයේ මෙම පක්ෂ වමට තල්ලු කර ගත හැකිය යන අදහස සසජාශි එකහෙලා ප්‍රතික්ෂේප කරයි.

බුෂ් පාලනාධිකාරියෙන් "වෙනසක්" බලාපොරොත්තුවෙන් බහුතරයක් තරුන ජනයා ඔබාමාට ඡන්දය දුන්හ. නව පාලන තන්ත්‍රය එහි පෙරගමන්කරුගේ දක්ෂිනාංශික පිලිවෙත් ගැඹුරු කිරීම පමනක් කරන තත්වය තුල දී මෙම බලාපොරොත්තු ඉතා වේගයෙන් කඩවීමට සහ වෛරයකට මාරු වී ඇත. *අපේක්ෂාවේ නිර්භීතභාවය* (දි ඔඩේසිටි ඔෆ් හෝප්)හි රචකයා වඩා ම නිර්භීත බොරු කියන්නා බවට පත් වී ඇත.

ඔබාමා පරිපාලනයේ අත්දැකීම ප්‍රදර්ශනය කරන්නේ පවත්නා ආයතනයන් තුල තවදුරටත් වෙනසක් නොමැති බවයි. එක්සත් ජනපද ප්‍රජාතන්ත්‍රවාදය නමට පමනයි; මැතිවරනයේ බොරු ආවරනය පිටුපසින් ඇත්තේ මූල්‍ය ප්‍රභූ පැලැන්තියට සේවය කරන පරිපූර්න වංචනික දේශපාලන ක්‍රමයකි.

සමාජය ප්‍රජාතන්ත්‍රවාදී, සමානාත්මතා සහ තාර්කික පදනමින් ප්‍රතිසංවිධානය කරන කම්කරුවන්ගේ ආන්ඩුවක් බලයට ගෙනඒමට සටන් කරන කම්කරු පන්තියේ මහජන ව්‍යාපාරයක් ගොඩනැගීම සසජාශි හි අරමුනයි.

## සමාජවාදය සහ ජාත්‍යන්තරවාදය සඳහා

ධනවාදයේ මූලිකාංගයන් දෙකක් වන නිෂ්පාදන මාධ්‍යයන්ගේ පුද්ගලික දේපල අයිතිය සහ ලෝක ආර්ථිකය ජාතික රේඛා ඔස්සේ බෙදී පැවතීම මිනිසාගේ නිෂ්පාදන බලවේගවල තාර්කික භාවිතයට සහ සංවර්ධනයට බාධාවක්ව පවතී. මානව වර්ගයා මුහුන දී සිටින කවර හෝ ගැටලුවක් ජාතික මට්ටමින් විසඳාලිය නොහැක.

සෑම රටකම කම්කරුවන් සහ තරුනයින් මුහුන දී සිටින ගැටලු මූලික වශයෙන් ම සමාන වේ. සෑම රටකදීම කම්කරු පන්තිය බෙදාලීමටත් දුර්වල කිරීමටත් පහසුවෙන් යොදා ගන්නා ජාතිකවාදයට, ස්වෝත්තමවාදයට, වර්ගවාදයට සහ ආරක්ෂනවාදයට සසජාශි එකහෙලා විරුද්ධ වේ. සෑම රටකම කම්කරු පන්තිය පොදු අරගලයක් මත ඒකාබද්ධ විය යුතු ය.

පුද්ගල ධනය නොව සමාජ අවශ්‍යතා සපුරාලන ආර්ථිකයේ තාර්කික සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් එනම් සමාජවාදය මතුවන්නේ ධනවාදයේ බිඳවැටීමේ ඓතිහාසික අවශ්‍යතාවෙනි. සමාජවාදය මානව වර්ගයාගෙන් අතිමහත් බහුතරය වන කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාව ආමන්ත්‍රනය කරන හෙයින් ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සම්බන්ධයෙන් සසජාශියට ඇත්තේ නොසෙලෙන විශ්වාසයකි.

සමාජවාදය ශාක්සාත් කර ගත හැක්කේ දැනුවත් ප්‍රෝත්සාහයක් මගින් පමනි. සටන දියත් කිරීමට ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතු ය. ශිෂ්‍යයන්ට තරුනයන්ට අප කැදවුම් කර සිටින්නේ මෙම අරගලය ඉදිරියට ගෙන යමින් සසජාශි ගොඩනගන ලෙසයි.

**සමාජවාදය සඳහා වූ අරගලයට එක්වන්න! සසජාශියට බැදෙන්න !**

*සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේත් සමාජවාදී සමානතා පක්ෂයේත් ශිෂ්‍යය ව්‍යාපාරයයි. හජාජාක ලොව පුරා වැඩිවශයෙන් කියවන සමාජවාදී ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය (www.wsws.org) ප්‍රකාශ කරනු ලබයි.*

*ලෝක සමාජවාදී වෙබ් අඩවියෙන් ඉදිරිපත් කරන ක්‍රියාමාර්ගය, ඉතිහාසය සහ විශ්ලේෂන බැරෑම්ව අධ්‍යනය කරන ලෙස අප ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටී. සසජාශියට බැදී එය ගොඩනැගීමට තීන්දු කරන්න, ඒවගේම ඔබගේ පාසලේ හො විශ්වවිද්‍යාලයේ සසජාශි කමිටු ගොඩනැගීමට උදව් වන්න.*